# සාමාන්‍ය සමයේ දස අටවන සතිය
# බ්‍රහස්පතින්දා

## පළමුවන කියැවීම

ගණන් කතාවෙන් ගත් පාඨයෙකි.

ගණන් කතාව 20 : 1-13

"ඔබගේ යස ඉසුරෙන් ඔවුනට ජල සම්පත් දුන මැනව."

පළමුවන මාසයේ දී මුළු ඉශ්රායෙල් ජනතාව ශීන් නම් පාළුකරයට ඇතුල් වී කාදේශ් නම් ස්ථානයේ නවාතැන් ගත්හ. එහිදී මීරියම් අපවත් වූයෙන්, ඈ භූමදාන කෙරිණ.

ජනතාවට එහි ජලය නොතිබුණු බැවින් ඔව්හු මෝසෙස්ට හා ආරොන්ට විරුද්ධව එක්රැස් වී මෝසෙස්ට අභියෝග කරමින්, "සමිඳාණන් වහන්සේ ඉදිරිපිට අපේ සොහොයුරන් නැසුණු විට අපිත් නැසුණෙමු නම් කෙතරම් හොඳද? ඔබ දෙදෙන සමිඳාණන් වහන්සේගේ සෙනග මේ පාළුකරයට ගෙනාවේ මන්ද? අපත් අපේ ගවමහිෂයනුත් මරා දමන්නට ද? ඔබ දෙදෙන මිසරයෙන් පිටතට අප ගෙනාවේ මන්ද? මේ කාලකණ්නි තැනට අප ගෙනෙන්නට ද? මෙතැන ධාන්‍යයටත්, අත්තික්කාවලටවත්, දෙළුම් ගස්වලටවත් තැනක් නොවේ. ඒ මදිවාට බොන්නට වතුරත් නැතැ"යි කීහ. එවිට මෝසෙස් සහ ආරොන් සෙනගගෙන් ඉවත්ව, සම්මුඛ මණ්ඩපයේ දොරකඩට ගොස් මුණින් තලා වැටුණාහ. සමිඳාණන් වහන්සේගේ මහිමාලංකාරය ඔවුන්ට දර්ශනය විය.

සමිඳාණන් වහන්සේ මෝසෙස් අමතමින්, තුඹේ සැරයටිය ගෙන තුඹත්, තුඹේ සොහොයුරු ආරොනුත් ජනතාවත් එකට රැස් කරන්න. එසේ රැස්

කොට, ඔවුන්ට පෙනෙන අර පර්වතයට අණ කරන්න. ඉන් වතුර ගලා යනු ඇත. නුඹ පර්වතයෙන් ගලා යන ඒ වතුර ඔවුන්ට දිය යුතුය. මෙසේ සෙනඟටත්, ඔවුන්ගේ සතුන්ටත් බොන්නට වතුර ලැබෙනු ඇතැ”යි වදාළ සේක. සමිඳාණන් වහන්සේ මෝසෙස්ට අණ කළ පරිදි, ඔහු උන් වහන්සේ ඉදිරිපිටින් සැරයටිය ගත්තේය. ඔවුන් දෙදෙන පර්වතය ඉදිරිපිට ජනතාව රැස් කළහ. ඉන්පසු මෝසෙස් ඔවුන් අමතමින් “දැන් ඉතින් කැරලිකරුවෙනි, මට සවන් දෙනු. මේ පර්වතයෙන් වතුර ගලා එවන්නට දැ”යි ඇසීය. ඔහු අත ඔසවා සැරයටියෙන් පර්වතයට දෙවරක් ගැසීය.

මහා ජල ධාරාවක් පිටාර ගැලීය. ජනතාව සහ ඔවුන්ගේ සත්තු එයින් බීවෝ ය.

සමිඳාණන් වහන්සේ මෝසෙස්ට හා ආරොන්ට කතා කොට, “ඉශ්රායෙල් ජනයා ඉදිරියෙහි මගේ ශුද්ධ බල මහිමය පිළිගන්නා තරමට නුඹලා මා කෙරෙහි විශ්වාසය නොතැබූ බැවින් මා මේ සෙනඟට දීමට පොරොන්දු වූ දේශයට නුඹලා ඔවුන් ගෙන නොයන්නහු ය”යි වදාළ සේක.

ඉශ්රායෙල් ජනයා සමිඳාණන් වහන්සේට විරුද්ධව දොස් තැබූ බැවිනුත්, ඒ වතුර මගින් උන් වහන්සේ සිය ශුද්ධ බල මහිමය ඔවුන්ට ප්‍රකාශ කළ බැවිනුත් ඒ වතුර “මෙරිබාහි වතුර”යි නම් කරනු ලැබීය.

දේව වාක්‍යය එසේය.

# පිළිතුරු ගීය

ගීතාවලිය 95: 1–2, 6–9

පිළිතුර: සමිඳුන් පවසන දෙයට සවන් දෙන්න.
ඔබේ සිත් දැඩිකර නොගන්න.

ගීය:

එන්න, සමිඳුන් හට ප්‍රීති ප්‍රමෝදයෙන් ගායනා කරමු. අප මිදූ පර්වතයාණන් හට සාදු හඬ නගා තුති ගී ගයමු. තුති ගී ගයා එතුමන් අබිමුවට ගමන් කරමු. එතුමන් හට ජය මංගල ගී ගයමු.

එන්න, හිස නමා එතුමන් හට නමස්කාර කරමු.
අප මැවූ සමිඳුන් අබිමුව දණින් වැටෙමු. එතුමාණෝ අපේ දෙවිඳාණෝ ය.
අපි එතුමන්ගේ සෙනඟය. එතුමාණන් පෝෂණය කරන බැටළුවෝ ය.
එතුමාණන් පවසන දේට සවන් දුන්නොත් යහපත!

“පාළුකරයේ මස්සා නම් ස්ථානයේ සිටි දවසේ දී මෙන් ද මෙරිබා නම් ස්ථානයේ දී මෙන් ද ඔබේ සිත් දැඩිකර නොගන්න.
එහිදී ඔබේ ආදි පියවරු මා පරීක්ෂා කළෝය. මාගේ ක්‍රියා දැක දැකත් මට අභියෝග කළෝය.

## සාධුකාරය (දෙවසරේම)

ආලේලූයා! ආලේලූයා!
සමිඳාණෝ සියලු පොරොන්දු ඉටු කරන සේක.
උන්වහන්සේ කරන සියල්ලේ දී මෙත් සිත් වඩන සේක.
ආලේලූයා!

නොහොත්

ආලේලූයා!
“මම ඔබට කියමි. ඔබ පේදුරු ය.
මේ පර්වතය පිට මාගේ සභාව ගොඩ නගන්නෙමි.
මරණයේ බලයට වුව ද එය පරාජය කළ නොහැකියැ”යි
සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 16: 13-23

“ඔබ පේදුරු ය. ස්වර්ග රාජ්‍යයේ යතුරු ඔබට දෙන්නෙමි.”

ජේසුස් වහන්සේ පිලිප්පි කාසිසාරියේ පෙදෙස්වලට පැමිණි කල “මනුෂ්‍ය පුත්‍රයාණෝ කවරෙක් ය කියා මිනිස්සු කියන්දැ”යි සිය <u>ශ්‍රාවකයන්ගෙන්</u> ඇසූ සේක. ඔව්හු කතා කොට, “සමහරෙක්, ස්නාවක ජුවාම් ය, කියා ද සමහරෙක් ‘එලියා ය’ කියා ද, අන් සමහරෙක් ‘ජෙරමියා නොහොත්

දිවැසිවරයන්ගෙන් කෙනෙක් ය' කියා ද කියති''යි කීහ. ''එහෙත් ඔබ මා කවරෙකු කියා කියන්නහු දැ''යි උන්වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක. සීමොන් පේදුරු උත්තර දෙමින් ''ඔබ ක්‍රිස්තුවරයාණෝ ය, ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය''යි කීය. ජේසුස් වහන්සේ උත්තර දෙමින් ''ජෝනාගේ පුත් සීමොන්, ඔබ ඉතා භාග්‍යවන්ත ය. මන්ද, ස්වර්ගයෙහි වැඩ වසන මාගේ පියාණන් වහන්සේ විසින් මිස මනුෂ්‍ය මඟකින් මෙය ඔබට හෙළිදරව් නොකරන ලද්දේය. මම ඔබට කියමි. ඔබ පේදුරු ය. මේ පර්වතය පිට මාගේ සභාව ගොඩනගන්නෙමි. මරණයේ බලයට වුව ද එය පරාජය කළ නොහැකිය. ස්වර්ග රාජ්‍යයේ යතුර ඔබට දෙන්නෙමි. ඔබ පොළොවෙහි දී යමක් බඳින්නෙහි ද, එය ස්වර්ගයෙහි දී බඳිනු ලබන්නේය. ඔබ පොළොවෙහි දී යමක් මුදන්නෙහි ද එය ස්වර්ගයේහි දී මුදනු ලබන්නේ ය''යි වදාළ සේක. තවද, තමන් ක්‍රිස්තුස් වහන්සේ බව කිසිවෙකුට නොකියන ලෙස උන්වහන්සේ ශ්‍රාවකයන්ට අණ දුන් සේක.
එවක් පටන් ජේසුස් වහන්සේ තමන් ජෙරුසලමට වැඩම කර, ප්‍රජා මූලිකයන්ගෙන් හා නායක පූජකයන්ගෙන් ද විනයධරයන්ගෙන් ද බොහෝ දුක් වේදනා විඳින්නටත් මරනු ලබන්නටත්, තුන්වනදා උත්ථාන කරනු ලබන්නටත් යන බව සිය ශ්‍රාවකයන්ට දන්වන්නට පටන් ගත් සේක.

එවිට පේදුරු උන්වහන්සේ පැත්තකට කැඳවා තරවටු කරන්නට පටන් ගෙන, ''ස්වාමිනි, එය දුරින් ම දුරු වේවා! එවැන්නක් ඔබට කවදාවත් සිදු නොවේවා''යි කීය. එහෙත් උන්වහන්සේ හැරී, පේදුරුට කතා කොට ''සාතන් අහකට යව. තුඹ මට බාධාවකි. තුඹ සිතන්නේ මිනිසුන් සිතන විදියට මිස දෙවියන් වහන්සේ සිතන විධියට නොවේ ය''යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.